

# කන්දොස්කිරියාව. . .

## පැළ බෙදිල්ල

මං දැක්කා ලබුහේනේ චන්දරා උන්දැ ඊයේ හැන්දෑවේ පාර දිගේ ආණ්ඩුවට බැන බැන යනවා, ගිය අවුරුද්දේ බෙදපු පැළ එකකවත් හරි ගියේ නෑ කියලා. ඒකට ඉතිං ආණ්ඩුවට බැනලා වැඩක් නෑ. උං දැනගන්ට ඕනෑ එව්වා හරි විදිහට නියම තැං වල හිටව ගන්ට.

මේ පළාතේ දේසගුණේ හැටියට මාස් කන්නෙට විතරයි හරියට වහින්නේ, යල් කන්නෙට වැස්ස අඩුයි. ඉතිං ගොඩ ඉඩං වල ඉබේ වැවෙන ගස් ඇරුණකොට අමුතුවෙන් ගස් හිටවන්ට අමාරු තමයි. එව්වා ඉඩෝරෙට අහුවෙලා මැරෙනවා. එක්කො ඒවා හැදීගෙන එනකොට එළුවෙක් හරි හරකෙක් හරි කාලදානවා. ඔය විදිහට නිකං බෙදපු පැළ කීදාහක් මේ පළාතේ විනාස වෙන්ට ඇත්ද? කොච්චර ප්‍රමාණයක් සල්ලි අපතේ යන්ට ඇත්ද?

පැළයක් හිටුවනකොට නියම තැනක් බලලා අඩි එකහමාරක් විතර දිගට පළලට උසට වළක් කොටන්ට ඕනෑ. ඊගාවට ඒකට දිරාපු ගොම හරි රොඩු වළකින් ගත්තු දිරාපු පොහොර හරි දමලා වලේ උඩ පස් එක්ක කවලං කරලා සති දෙකක් වත් තියන්ට ඕනෑ. වැහි කාලෙක පැළේ හිටවනවනං හොඳයි. පැළේ හිටවනකොට පැළේ තියන ඉටි මල්ල අයිං කොරන්ට ඕනෑ. සමහර උන්දලා ඉටි මල්ල එක්ක තමයි හිටවන්නේ.

ඊට පස්සේ ඔය වල ඇතුලේ පැළේ, පුරවපු පස් වල හිටවනවා. පැළේ හුළඟට හෙලවෙනවට අඩි දෙකක් විතර උස කෝටුවක් පැළේ ගාව හිටවලා ඒකට අල්ලලා බැඳලා දානවා. පැළේ ආරක්ෂාවට වළ වටේ පැළේට අඩි දෙකක් විතර ඈතින් පැළවෙන ඉනි වැටක් රවුමට හිටෙව්වොත් බොහොම හොඳා. වැටහිරියා කෝටු හිටෙව්වොත් ඒවාගේ කෙළ දළු පැළේට පොහොරක් විදිහට දාන්ට පුළුවන්. ඉඩෝර කාලයක් ආවොත් උදේ හවස වතුර දාන්ට ඕනේ. වතුර හිඟ නං පැළේ මුලට කිට්ටුවෙන්ට පුච්චපු නැති කලගෙඩියක් අරගෙන ඒක එතන වළලලා වතුර පුරවලා උඩින් පොල්කට්ටක් වහලා තියන්ට ඕනෑ. වතුර අඩුවන හැටි බලලා කලේ පුරවන්ට ඕනෑ. ඔය විදිහට හැදුවොත් ඕනෑ පැළයක් පරිස්සං කරගන්ට පුළුවං. උවුරුදු දෙකක් විතර ගිහිං පැළේ හොඳට හැදුනට පස්සේ පැළවූ වැට ඉනි රවුම අයින් කරලා දාන්ට පුළුවං. ඔය විදිහට නිකං තියන ඉඩං වල පැළ හිටවගත්තොත් අමතර ආදායමක් ලබාගන්ට පුළුවං. පහුගිය සුමානෙ හිච්චි එකා අවාරේ අඹ ගෙඩි දෙකක් ටවුමෙං ගෙනාවා දෙකටම දෙසීයයි ආයුබොවන්.

සිලිං අත්තා.

